සඳහන් කළ යුතුයි.

මේ පසුබිම තුල මගේ පෞද්ගලික ජීවිතයේ දී මා විසින් කාලයක් පුරා භාවිතාවට ගත් සංකල්ප කිහිපයක්ම මගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වන මෙම පාසල් පද්ධතිය තුල අනුයුක්ත කිරීමට මා පෙළඹුණා. ඒවා නම් වශයෙන් සඳහන් කළොත්,

1. Integrity (අවංකභාවය)
2. Intellect (බුද්ධිමත්භාවය)
3. Humility (නිහතමානීභාවය)
4. Driving for Excellence (විශිෂ්ඨත්වය කරා ළඟා වීම)

යන කාරණායි.

විදුහල්පතිනිය ලෙස මගේ රාජකාරී වශයෙන් මා තුල වූ අපමණ ගැටළු වලට පිළිතුරු සෙවීමේ උවමනාව විසින් මේ සංචාරය කෙරෙහි මා යොමුකරනු ලැබුවා. ශ්‍රී ලාංකීය සංගීතය, ගෘහනිර්මාණ ශිල්පය, ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳව ඔවුන්ගේ කෞශල්‍ය එමෙන්ම ඔවුන්ගේ අතිශය ගැඹුරු සහ විශිෂ්ඨ ඉතිහාසය පිළිබඳවත් පසුකාලීනව ඔවුන් මුහුණ දුන් යුධමය වාතාවරණය පිළිබඳවත් කිසියම් අදහසක් ඇතිකර ගැනීමට සංචාරය අවසානයේ මට හැකි වුණා. එසේම ඔවුන් විටින් විට යුරෝපා යටත්විජිතයක් ලෙස පැවතීම සහ එහි බලපෑම වැනි පුළුල් පරාසයකට විහිදී ගිය කාරණා බොහොමයක් ගැන අධ්‍යයනය කෙරුණු අර්ථාන්විත සංචාරයක් ලෙස ශ්‍රී ලංකා සංචාරය මට තදින් හිතට වැදුණු ගමනක්. ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලය , කොළඹ රාජකීය විද්‍යාලය වැනි කොළඹ



හා තදාසන්න පාසල් කිහිපයක සංචාරය කරන්නටත් මට අවස්ථාව ලැබුණා. එරට අධ්‍යාපන ක්‍රමය පිළිබඳවත් පාසල් පද්ධතිය පිළිබඳවත් මා අතිශය විශ්මයට පත්වුණා යැයි කීවොත් නිවැරදියි. ඔවුන්ගේ රමණීය පාසල් නිළ ඇඳුම ඇතුළුව අධ්‍යාපන ක්‍රමයත් සමස්ථ පාසල් පද්ධතියත් ඉතාම විශිෂ්ඨ තත්ත්වයක පවතින බව කිව යුතුයි. ඇතැම් පාසල් වල ගුරුවරුන් සමඟත් මා කථාබහ කළා. මට එහිදී තේරුම් ගියේ ගුරුවරයාගේ කාර්යයභාරය කුමන රටකදී වුවත් විහිදී යන්නේ එකම පරාසය තුල බවයි. ගුරුවරයාගේ කාර්යයභාරය ඕනෑම සංස්කෘතික වටපිටාවක් තුළදී වුවත් විශ්වීය ලක්ෂණ පිළිබිඹු කරනවා.

ජීවිතය තුලදී තීරණ ගැනීමේ දී සහ තීරණ ක්‍රියාත්මක කිරීමේදී ඉහත මා දැක්වූ සංකල්ප හෙවත් හරයයන් මට බෙහෙවින් ඉවහල් වෙනවා.හොඳ නායකත්වයක් යටතේ පාසල තුල ඉදිරි ගමනක් ඇතිකිරීමට මෙම වටිනාකම් අතිශයින්ම වැදගත් වන කාරණා බව විශේෂයෙන්ම සඳහන් කළ යුතුයි.

**මෑතකදී ඔබ විසින් සිදුකරනු ලැබූ ශ්‍රීලංකා සංචාරය සහ එහි අරමුණු පිළිබඳවත් අප යමක් කථා කළ යුතුයි නේද?**

සත්තකින්ම ඔව්. මා පැහැදිලිවම සඳහන් කළ යුතු පළමු කාරණය වන්නේ ශ්‍රී ලාංකිකයින් ඉතාම යහපත් සහ ආගන්තුක සත්කාරයයන් විෂයෙහි අතිශයින් උනන්දු මිත්‍රශීලී ප්‍රජාවක් ලෙස මා විසින් හඳුනාගත් බව. මට එරට තුල සංචාරය කිරීමේදී එක්තරා මහත්මයෙක් නිරන්තරයෙන් ම උදව් කරා. මට හැකිපමණ රට අභ්‍යන්තරයේ සංචාරය කිරීමට අවස්ථාව ලැබුණා. ශ්‍රී ලංකාව ස්වභාවික සෞන්දර්යය අතින් ඉහළ තැනක පවතින දර්ශනීය රටක්. මගේ සංචාරයේ මුඛ්‍ය අරමුණ වූයේ ශ්‍රී ලාංකිකයින් පිළිබඳ යම්තාක් දුරට හැදෑරීමයි. මන්දයත් වර්ථමානයේ අප පාසල් පද්ධතිය තුල ශ්‍රී ලාංකික සංස්කෘතික පසුබිමක් සහිත දරුවන් විශාල පිරිසක් සිටිනවා. ඒ වගේම ඒ දරුවන් සුවිශේෂ දක්ෂතා සහිත දරුවන් පිරිසක් බවත් මට වැටහුණා. මගේ පුද්ගලික අත්දැකීම් අනුව මා තේරුම්ගත් කාරණයක් වන්නේ අප කිසියම් ප්‍රජාවක් වෙත භෞතිකව සමීප වූ පමණට ඔවුන් පිළිබඳව අධ්‍යයනය කිරීම වඩාත් පහසු වනවා.
ආරම්භයේදී ශ්‍රී ලාංකිකයන් පිළිබඳව මා තුල වුයේ අල්ප අවබෝධයක් බැවින් මේ සංචාරය කෙරෙහි මා විශේෂයෙන් උනන්දු වූවා.

ඔවුන්ගේ ආරම්භය කොතැනද? ඔවුන් ගේ සංස්කෘතිකමය වටිනාකම් මෙනෙවාද යනාදී

***St. Margaret's සහ Berwick Grammar යන පාසල් ද්වත්වය තුල ඉදිරි අනාගතයේදී ක්‍රියාත්මක වීමට නියමිත නව සැලසුම් සහ ව්‍යාපෘති මොනවාද ?**

මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමේදී අප පාසල් තුල ක්‍රියාත්මක වන සංකල්පනාත්මක කාරණා හතරක් පිළිබඳව මා පළමුකොටම සඳහන් කරන්නම් . ඒවා පිළි වෙලින් මෙසේයි.

1. Courage නිවැරදිම දේ තෝරාගෙන ක්‍රියාත්මක කිරීමට ඇති ධෛර්යය
2. කුතුහලය Curiosity
   යමක් පිළිබඳව සොයා බලා ඉගෙනුමට ඇති කුතුහලය
3. prahdj Charactor
   තමා විසින් සමාජයට ඉදිරිපත් කළ හැකි තමන්ගේ හොඳම චර්යාව
4. ගරුත්වය Respect
   තමන්ටත් අන්‍යයන්ටත් ගරු කිරීමේ ප්‍රවණතාව

අප පෙරදී විග්‍රහ කළ ගෝලීය පුරවැසියකු බිහිකිරීම යන කාරණාවේදී ඉදිරියෙන්ම සිටින ප්‍රධාන බලකණු හතර වන්නෙත් මා ඉහත කී සංකල්ප හතරයි. සමස්ථ පාසල් පද්ධතිය තුලම ක්‍රියාත්මක වන හරය ඒ තුල සංක්ෂිප්ත කොට දක්වා තිබෙනවා.
අප පාසල තුල ක්‍රියාත්මක වන Growing Good Men යන ව්‍යාපෘතිය අප බාලක පාසලේ ප්‍රධානී ආචාර්ය Steven Middleton ගේ සංකල්පයක්. එහි මුඛ්‍ය පරමාර්ථය සමස්ථ විශ්වයටම මෙහෙවරක් කළ හැකි පුරවැසියකු බිහිකිරීමයි. ලෝකය වඩා යහපත් තලයකට ගෙනයෑමට අවශ්‍ය අමුද්‍රව්‍ය දරුවන් වෙත ලබාදීම එම ව්‍යාපෘති යේ අරමුණයි. මෙම ව්‍යාපෘතිය ගොඩනැගෙන්නේ චර්යාව යන අපගේ මූලික සංකල්පය කේන්ද්‍ර කරගෙනයි.
ගරුත්වය යන සංකල්පය පාදක කරගෙන අප විසින් ක්‍රියාත්මක කරන තවත් ව්‍යාපෘතියක් තිබෙනවා, Time and Space යනුවෙන් අප විසින් නම්කරන ලද. මා පෙරදී සඳහන් කළ පරිදි ගරුත්වය යන ස්ථම්භය තුල මානව සම්බන්ධතා වලට වැඩි ඉඩක් ලබාදීම අපේ පරමාර්ථයයි. මෙහිදී පියා සහ දරුවා අතර සම්බන්ධතාවය මව සහ දරුවා අතර සම්බන්ධතාවය වැනි කුටුම්භගත සම්බන්ධතා කෙරෙහි යොමුවූ ව්‍යුහගත ආකෘතියක් අනුව සකස් වූ මෙම ව්‍යාපෘතිය අප ඉතා උනන්දුවෙන් බලා සිටින කටයුත්තක්. ඒ ඇරුණු කොට දරුවන් ප්‍රිය කරන වැඩසටහන් හඳුන්වා දීමටත් අප උනන්දු වෙනවා.

විශේෂයෙන්ම අපේ බාලක පාසල තුල ක්‍රියාත්මක වන Advance Coding Work Shops වැනි විවිධ වැඩසටහන් මෙන්ම රොබෝ තාක්ෂණය පිළිබඳ වැඩමුළු මගින් දරුවන් ප්‍රබෝධමත් කිරීම මගින් ඔවුනට දැනුම ලබාදීම තමා අපේ අරමුණ වන්නේ. අපේ පාසල් ද්විත්වය තුලම ක්‍රියාත්මක වන HPV (Human Powered Vehicle) Program යන වැඩසටහන් මාලාව දරුවන් සහ දෙමව්පියන් යන පාර්ශව දෙකේම මැදිහත්වීම මත දිවෙන සාර්ථක ව්‍යාපෘතියක්. මෙවැනි වැඩසටහන් සෑම පාසලකම පාහේ දකින්නට නොලැබෙන්නක්. මන්දයත් මෙබඳු වැඩසටහන් සැමවිටම පාසලේ මූලික සංකල්ප සමඟ බැඳුණු කාරණයක් වන නිසා. මා හැමවිටම ඔබට ඒත්තු ගැන්වීමට උත්සාහ කළේ පාසලක දැක්ම සහ හරයයන් සෑමවිටම එම පාසලේ පදනම බවට පත් වන ආකාරයයි.

අපේ බාලිකා පාසල GSV (Girls Sports Victoria) යන නිර්ණායක යටතේ කාණ්ඩගත වූ පාසලක්. එනම් ක්‍රීඩා අංශයෙන් උසස්ම වර්ගීකරණයක ට ලක් වූ පාසලක්. අපේ බාලක පාසල SIS (Southern Independent School) යන කාණ්ඩයට අයත් නිසා විශාල පරාසයක පැතිරුණු ක්‍රීඩාවන් වලට අවස්ථාව ලැබෙනවා.එනිසා ක්‍රීඩා කිරීමට ප්‍රිය කරන දරුවන් වෙනුවෙන් අවස්ථා බහුල පාසලක් බවත් කිව යුතුයි. ඒ ඇරුණු කොට ඉගෙනුම් ක්‍රියාවලිය තුල දරුවා ගේ අනාගතය යොමුවන්නේ කවර දිශාවකටද යන ඉලක්කය සපුරා ගැනීම වෙනුවෙන් තවත් නව ව්‍යාපෘති නිර්මාණය වෙමින් පවතිනවා මා උක්ත දැක්වූ සංකල්ප හතර ඔස්සේ.

***තම දරුවා සඳහා පාසලක් තෝරා ගැනීමේදී දෙමව්පියන් විසින් සැලකිල්ලට ගතයුතු කාරණා ලෙස ඔබ දකින්නේ මොනවාද?**

එය ඉතාම වැදගත් ප්‍රශ්නයක්. මා ඒ සඳහා පිළිතුරු දෙන්නේ ඉතාම කැමැත්තෙන්. මා නැවතත් අපේ පාසල් පද්ධතිය තුල ක්‍රියාත්මක වන සංකල්පනාත්මක හරයයන් හෙවත් වටිනාකම් වෙත ඔබේ අවධානය යොමු කරන්නට කැමතියි. ඔබේ පවුලේ සංකල්ප සහ ඔබ විසින් ඔබේ දරුවා වෙනුවෙන් තෝරා ගනු ලබන පාසල තුල දිවෙන සංකල්ප අතර සමපාත වීමක් ඔබ දකිනවා නම් එය ඔබ ගත් නිවැරදි තීරණයක් බව කිව හැකියි.

සෑම පාසලක්ම එකිනෙකින් වෙනස්. වාසනාවට මෙන් Australian College of Educations යන ආයතනයේ සභාපතිනිය ලෙස මා කලක් සේවය කළ නිසා රජයේ පාසල්, කතෝලික පාසල් සහ ස්වාධීන පාසල් යන සියළුම වර්ග වල පාසල් වල ව්‍යුහය පිළිබඳව කිසියම් හැදෑරීමක් මා තුල තිබෙනවා. එනිසයි මා පැහැදිලිව කියන්නේ සෑම පාසලක්ම එකිනෙකින් වෙනස් බව. ඒ වෙනසට හේතුව ඒ ඒ පාසල තුල බලගැන්වෙන සංකල්පමය වටිනාකම් වල වෙනස. නිදසුනක් ලෙස ඇතැම් පාසලක් භාෂා දැනුම ව්‍යාප්ත කිරීම මගින් අන්තර් සංස්කෘතික සම්බන්ධතා දිරිගැන්වීමේ සංකල්පය තුල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් සිසුන් ගේ ප්‍රගතිය සමාලෝචනය කරනවා විය හැකියි.

අප පාසල් පද්ධතිය පවුල මූලික කරගත් සංකල්ප බල ගන්වන පාසලක්. එවිට එය ඇතැම් පවුල් සඳහා ගෝචර වුවත් තවත් පවුල් වලට සුදුසු නොවන්නට පුළුවන්. අපේ පාසල සහ පාසලට සම්බන්ධ සියළුම පවුල් එක ප්‍රජාවක් ලෙසයි අප දකින්නේ. දවස අවසානයේ දරුවා පාසලෙන් කැඳ වාගෙන යන විට තම දරුවා දවසේ වැඩි කාලයක් ගෙවා දැමූ පාසල සහ දරුවා අතර පවතින සම්බන්ධතාවය පිළිබඳව ඔබට සතුටට පත්විය හැකි නම් එය තමා නිවැරදීම තේරීම.

ඒ ඇරුණු කොට කිසියම් පාසලක අධ්‍යාපන ප්‍රතිඵල පිළිබඳවත් අප අතිශයින්ම සංවේදී විය යුතුයි පාසලක් තෝරා ගැනීමේදී. අප පාසලේ අධ්‍යාපන ප්‍රතිඵල ඉතාම හොඳ තත්ත්වයක පවතිනවා. නමුත් එපමණක්ම නොවේ අප අංග සම්පූර්ණ දරුවකු පිළිබඳ වගකීම දරනවා නිසැකයෙන්ම. විශේෂයෙන්ම පූර්ණ කාලීනව රැකියා වල නියුතු කාර්යය බහුල දෙමව්පියන්ගේ දරුවන් වෙනුවෙන් අප විශේෂ අවධානයක් යොමු කරනවා.

ඒ ඇරුණු කොට පාසලක ප්‍රධාන භූමිකාවකට පණ පොවන ගුරුවරුන් පිළිබඳවත් අප සැලකිලිමත් විය යුතුයි දරුවන් වෙනුවෙන් පාසලක් තෝරා ගැනීමේදී. ගුරුවරුන් යාවත්කාලීන වූ දැනුමක් සහිත පිරිසක්ද යන්න පාසලේ ගුණාත්මකබාවය තීරණය කරන වැදගත් සාධකයක්. ඔවුන්ගේ අධ්‍යයනයන් කවර අංශ කෙරෙහි ප්‍රචලිත වී තිබේද ඔවුන්ගේ ශානරය, ඔවුන්ගේ ආකෘතිය සහ ඔවුන්ගේ භාවිතාවන් කවරේද යන්න පිළිබඳව ඔබ සලකා බැලිය යුතු බව මා යෝජනා කරන්න කැමතියි.

ඔබේ ප්‍රශ්ණයට පිළිතුර අවසානයේදී මෙසේ ලඝු කොට කිව හැකියි. පාසලක සංකල්පනාත්මක වටිනාකම්, අධ්‍යාපන ප්‍රතිඵල, ගුරුවරුන්ගේ අධ්‍යයනයන් සහ පාසල පිළිබඳ සාමාන්‍ය වැටහීම යන කරුණු අප විසින් සලකා බැලිය යුතුයි, අපේ දරුවන් වෙනුවෙන් අපට ගැලපෙන පාසල තෝරා ගැනීමේදී.

***Learn to be Happy- Happy to be learn* යන්න අප පාසලේ මූලික පරමාර්ථයයි. එනිසා ඔබ වෙතින් බිහි කරගත හැකි වඩාත් යහපත්ම පුද්ගලයා අද ට වගේම අනාගත විශ්වය වෙනුවෙනුත් මානව සංහතියේ යහපැවැත්ම වෙනුවෙනුත් ගොඩනංවා ගැනීම සඳහා ක්‍රියාත්මක වන්න යන පණිවිඩය ශ්‍රී ලාංකික ප්‍රජාව වෙනුවෙන් ලබාදීමට මා අවසාන වශයෙන් කැමතියි.**

උපේක්ෂා සේනානායක